**පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය - 2017 දෙසැම්බර්**

**සංස්කෘත I (SANG 1)**

**නිර්දිෂ්ට ග්‍රන්ථ හා ව්‍යාකරණ**

**කාලය : පැය තුනයි.**

**පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටත් දෙවන කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව අටකි.**

---

## I කොටස

1. (අ) සිංහලයට නගන්න.

सहस्रशीर्षा पुरुषः सहस्राक्षः सहस्रपात् । स भूमिं विश्वतो वृत्वात्यतिष्ठद्दशाङ्गुलम् ॥ 1 ॥
पुरुष एवेदं सर्वं यद्भूतं यच्च भव्यम् । उतामृतत्वस्येशानो यदन्नेनातिरोहति ॥ 2 ॥
एतावानस्य महिमातो ज्यायाँश्च पूरुषः । पादोऽस्य विश्वा भूतानि त्रिपादस्यामृतं दिवि ॥ 3 ॥
त्रिपादूर्ध्व उदैत्पुरुषः पादोऽस्येहाभवत् पुनः। ततो विष्वङ् व्यक्रामत्साशनानशने अभि ॥ 4 ॥

॥ ऋग्वेदः X.90.1 - 4 ॥

(ආ) විශ්වනිර්මාණය පිළිබඳ ඍග්වෛදික දාර්ශනික සංකල්පනා මොනවාදැ යි සාකච්ඡා කරන්න.

2. (අ) සිංහලයට නගන්න.

दृष्ट्वा च तं राजसुतं स्त्रियस्ता
जाज्वल्यमानं वपुषा श्रिया च ।
धन्यास्य भार्येति शनैरवोच-
ञ्छुद्धैर्मनोभिः खलु नान्यभावात् ॥ २३ ॥

अयं किल व्यायतपीनबाहु
रूपेण साक्षादिव पुष्पकेतुः ।
त्यक्त्वा श्रियं धर्ममुपैष्यतीति
तस्मिन् हि ता गौरवमेव चक्रुः ॥ २४ ॥

कीर्णं तथा राजपथं कुमारः पौरैर्विनीतैः शुचिधीरवेषैः ।
तत्पूर्वमालोक्य जहर्ष किंचिन्मेने पुनर्भावमिवात्मनश्च ॥ २५ ॥
पुरं तु तत्स्वर्गमिव प्रहृष्टं शुद्धाधिवासाः समवेक्ष्य देवाः ।
जीर्णं नरं निर्ममिरे प्रयातुं संचोदनार्थं क्षितिपात्मजस्य ॥ २६ ॥

॥ बुद्धचरितमहाकाव्यम् ॥

(ආ) අශ්වඝෝෂපාදයන්ගේ බුද්ධචරිතය බෞද්ධ දාර්ශනික ඉගැන්වීම් සහිත මහාකාව්‍යයක් දැ යි විමසන්න.

3. (අ) සිංහලයට නගන්න.

अथासावुष्णमायतं च निःश्वस्याशंसत्—'आसीत्तादृशो मुनिरस्मि-
न्नाश्रमे। तमेकदा काममञ्जरी नामाङ्गपुरीवतंसस्थानीया वारयुवतिर-
श्रुबिन्दुतारकितपयोधरा सनिर्वेदमभ्येत्य कीर्णशिखण्डास्तीर्णभूमिर-
भ्यवन्दिष्ट। तस्मिन्नेव च क्षणे मातृप्रमुखस्तदाप्तवर्गः सानुक्रोशमनु-
प्रधावितस्तत्रैवाविच्छिन्नपातमपतत्। स किल कृपालुस्तं जनमार्द्रया
गिराश्वास्यार्तिकारणं तां गणिकामपृच्छत्। सा तु सव्रीडेव सविषा-
देव सगौरवेव चाब्रवीत्—'भगवन्, ऐहिकस्य सुखस्याभाजनं
जनोऽयमामुष्मिकाय श्वोवसीयायार्ताभ्युपपत्तिवित्तयोर्भगवत्पादयोर्मूलं
शरणमभिप्रपन्नः' इति। तस्यास्तु जनन्युदञ्जलिः पलितशारशि-

॥ दशकुमारचरितम् ॥

(ආ) සංස්කෘත ගද්‍යකාව්‍ය සාහිත්‍යය තුළ දණ්ඩින්ගේ දශකුමාරචරිතය සුවිශේෂී වන්නේ කවර හේතු නිසා දැ යි විමසන්න.

4. සිංහලයට නගන්න.

। ततः प्रविशति कञ्चुकी ।

कञ्चुकी । देव अमात्यो विज्ञापयति । अनुष्ठिता प्रभोराज्ञा ।

एतौ पुनर्हरदत्तगणदासौ
उभावभिनयाचार्यौ परस्परजयोद्यतौ ।
त्वां द्रष्टुमिच्छतः साक्षाद्भावाविव शरीरिणौ ॥ १० ॥

राजा । प्रवेशय तौ ।

कञ्चुकी । यदाज्ञापयति देवः । इति निष्क्रम्य पुनस्ताभ्यां सह प्रविश्य । इत इतो भवन्तौ ।

हरदत्तः । राजानमवलोक्य । अहो दुरासदो राजमहिमा । तथा हि ।

न च न परिचितो न चाप्यगम्यश्
चकितमुपैमि तथापि पार्श्वमस्य ।
सलिलनिधिरिव प्रतिक्षणं मे
भवति स एव नवो नवोयमक्ष्णोः ॥ ११ ॥

गण० । महत्खलु पुरुषाधिकारमिदं ज्योतिः । तथा हि ।

द्वारे नियुक्तपुरुषानुमतप्रवेशः
सिंहासनान्तिकचरेण सहोपसर्पन् ।
तेजोभिरस्य विनिवर्तितदृष्टिपातैर्
वाक्यादृते पुनरिव प्रतिवारितोऽस्मि ॥ १२ ॥

कञ्चुकी । एष देवः । उपसर्पतां भवन्तौ ।

उभौ । उपेत्य । विजयतां देवः ।

राजा । स्वागतं भवद्भ्याम् । परिजनं विलोक्य । आसने तावदत्र भवतोः ।

॥ मालविकाग्निमित्रम् १ ॥

## II කොටස

5. ෂෂ්ඨී සහ සප්තමී විභක්තිවල ප්‍රයෝග නිදසුන් සහිතව දක්වන්න.

6. ස්වරයන්ගෙන් සහ ව්‍යඤ්ජනයන්ගෙන් ඇරඹෙන පද විෂයෙහි විසර්ග සන්ධිය සිදු වන ආකාරය විවිධ බව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

7. සතරාකාර සමාස ප්‍රභේද හඳුන්වා දී බහුව්‍රීහි සමාසය නිදසුන් සහිත ව විස්තර කරන්න.

8. පහත සඳහන් පද පිළිබඳ ව්‍යාකරණ සටහන් ලියන්න.

    i. ගන්තව්‍යම්
    ii. ලේඛිතුම්
    iii. පිපඨීෂති
    iv. තිෂ්ඨන්තී
    v. කෘත

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය - 2017 දෙසැම්බර්

## සංස්කෘත II (SANG 2)

## අනිර්දිෂ්ට ග්‍රන්ථ සහ අලංකාරශාස්ත්‍ර ප්‍රවේශය

කාලය : පැය තුනයි

පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටත් දෙවන කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතකි.

---

### I කොටස

1. සිංහලයට නගන්න.

बृहदश्व उवाच ।

दमयन्ती तु तच् छ्रुत्वा वचो हंसस्य भारत ।
ततः प्रभृति न स्वस्था नलं प्रति बभूव सा ॥१॥
ततश् चिन्तापरा दीना विवर्णवदना कृशा ।
बभूव दमयन्ती तु निःश्वासपरमा तदा ॥२॥
ऊर्ध्वदृष्टिर् ध्यानपरा बभूवोन्मत्तदर्शना ।
पाण्डुवर्णा क्षणेनाथ हृच्छयाविष्टचेतना ॥३॥
न शय्यासनभोगेषु रतिं विन्दति कर्हि चित् ।
न नक्तं न दिवा शेते हा हेति रुदती पुनः ॥४॥

ततो विदर्भपतये दमयन्त्याः सखीजनः ।
न्यवेदयत् ताम् अस्वस्थां दमयन्तीं नरेश्वरे ॥५॥
तच् छ्रुत्वा नृपतिर् भीमो दमयन्तीसखीगणात् ।
चिन्तयामास तत् कार्यं सुमहत् स्वां सुतां प्रति ॥६॥
स समीक्ष्य महीपालः स्वां सुतां प्राप्तयौवनाम् ।
अपश्यद् आत्मना कार्यं दमयन्त्याः स्वयंवरम् ॥७॥
स संनिमन्त्रयामास महीपालान् विशां पतिः ।
अनुभूयताम् अयं वीराः स्वयंवर इति प्रभो ॥८॥

2. සිංහලයට නගන්න.

अस्ति मगधदेशे चम्पकवती नामारण्यानी। तस्यां चिरान्महता स्नेहेन मृगकाकौ निवसतः। स च मृगः स्वेच्छया भ्राम्यन्पुष्टाङ्गः केन चित्सृगालेनावलोकितः। तं दृष्ट्वा सृगालोऽचिन्तयत्। आः। कथमेतन्मांसं सुललितं भक्षयामि। भवतु। विश्वासं तावदुत्पादयामि। इत्यालोच्योपसृत्याब्रवीत्। मित्र। कुशलं ते। मृगेणोक्तम्। कस्त्वम्। जम्बुको ब्रूते। क्षुद्रबुद्धिनामा जम्बुकोऽहम्। अत्रारण्ये मित्रबन्धुहीनो मृतवदेकाकी निवसामि। इदानीं भवन्तं मित्रमासाद्य पुनः सबन्धुर्जीवलोकं प्रविष्टोऽस्मि। अधुना मया तवानुचरेण सर्वथा भवितव्यम्। मृगेणोक्तम्। एवमस्तु। ततोऽस्तं गते सवितरि भगवति मरीचिमालिनि मृगस्य वासभूमिं प्रति मृगजम्बुकौ गतौ। तत्र चम्पकवृक्षशाखायां सुबुद्धिनामा काको मृगस्य चिरमित्रं निवसति। तौ दृष्ट्वा काकोऽवदत्। सखे चित्राङ्ग। कोऽयं द्वितीयः। मृगो ब्रूते। जम्बुकोऽयमस्मत्सख्यमिच्छन्नागतः। काको ब्रूते। मित्र। अकस्मादागन्तुना सह विश्वासो नैव युक्तः। तन्न भद्रमाचरितम्। तथा चोक्तम्।

अज्ञातकुलशीलस्य वासो देयो न कस्य चित्।
मार्जारस्य हि दोषेण हतो गृध्रो जरद्गवः॥

॥ हितोपदेशः॥

## II කොටස .

3. පළමුවරට සංස්කෘත කාව්‍යමය මූලබීජ හමුවන මූලාශ්‍රයයන් හඳුන්වා දී 'රාමායණමාදිකාව්‍යම්' යන ප්‍රකාශය පිළිගත හැකිදැ යි විමසන්න.

4. සංස්කෘත කාව්‍ය සාහිත්‍යය එහි විවිධ ප්‍රවර්ග සඳහා නිදසුන් සපයමින් කෙටියෙන් හඳුන්වා දෙන්න.

5. ශබ්දාලංකාර සහ අර්ථාලංකාර කාව්‍යයෙහි හරය යැයි සනාථ කිරීමට ප්‍රයත්න දැරෙන, ඔබ කැමති ඕනෑම සංස්කෘත කාව්‍ය විචාර ග්‍රන්ථයක අන්තර්ගතය පිළිබඳ ප්‍රාමාණික රචනයක් ලියන්න.

6. "වක්‍රෝක්තිය සහ ධ්වනිය යනු එකක් ම ය." සංස්කෘත සාහිත්‍ය විචාර සංකල්ප ඇසුරින් මේ ප්‍රකාශය නිදසුන් සහිත ව විචාරයට ලක් කරන්න.

7. කාව්‍ය රීති සහ මාර්ග සංකල්ප පිළිබඳ ව සංස්කෘත ආලංකාරියන් දැරූ මතවාද විවරණය කරන්න.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය - 2017 දෙසැම්බර්

## සංස්කෘත III (SANG 3)

## සංස්කෘත දෘශ්‍යකාව්‍ය සහ වෛදික සාහිත්‍ය ඉතිහාසය

කාලය : පැය තුනයි

එක කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව අටකි.

---

### I කොටස - දෘශ්‍ය කාව්‍ය

1. "කාලිදාසට පසු ව බිහි වූ දෘශ්‍යකාව්‍ය රචකයෝ සියලුදෙනා ම ඔහුට පෙර විසූ රචකයන්ට වඩා ඉහළ කුසලතා පෙන්වූහ." මේ ප්‍රකාශය පිළිබඳ ව සංස්කෘත දෘශ්‍යකාව්‍ය සාහිත්‍යය ඇසුරින් විවේචනාත්මක රචනයක් ලියන්න.

2. සංස්කෘත නාට්‍යශාස්ත්‍රයේ ඉගැන්වෙන අන්දමට "ප්‍රාප්ත්‍යාශා" යනු කෙබඳු අවස්ථාවක් දැ යි නිර්දිෂ්ට දෘශ්‍යකාව්‍ය කෘතිවලින් නිදසුන් දෙමින් විමසන්න.

3. "විදූෂක යනු හුදෙක් ප්‍රේක්ෂකයාට විනෝදාස්වාදය සැපයීමට පමණක් භාවිත චරිතයක් නො වේ." මෙම මතයට පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු දක්වන්න.

4. සංස්කෘත දෘශ්‍යකාව්‍යයන්හි දී අපට හමුවන චරිත එකල සමාජයේ විවිධ පැතිකඩ හෙළි කරන ආකාරය නිර්දිෂ්ට කෘතිවලින් නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

### II කොටස - වෛදික සාහිත්‍ය ඉතිහාසය

5. හුදු ස්තුති ගීතිකාවල සිට ගැඹුරු දාර්ශනික සාකච්ඡා දක්වා වෛදික සාහිත්‍යය විහිදී ගිය ආකාරය නිදසුන් දෙමින් විවරණය කරන්න.

6. අථර්වවේදය පොදුජනයාගේ වේදය වශයෙන් හැඳින්වීමට ඇතැම් විචාරකයන් පෙළඹෙන්නේ මන්දැයි පැහැදිලි කොට එහි සාධාරණත්වය සාකච්ඡා කරන්න.

7. කාව්‍යමය ලක්ෂණ අතින් ඉහළ සාග්වේද සූක්ත පිළිබඳ ව නිදර්ශනාත්මක රචනයක් ලියන්න.

8. වේදයේ ප්‍රවර්තනය උදෙසා වේදාංග සාහිත්‍යය නිර්මාණය වූ ආකාරය පැහැදිලි කරන්න.